# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1789/14 – 2012 දෙසැම්බර් 17 වැනි සඳුදා – 2012.12.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/10/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණ පිළිබඳව–

ජේ. එස්. පී. කොස්තා මයා, අංක 139, උයන පාර, මොරටුව

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

වත්තල, හැඳල, නිමල මරියා මාවත, නො. 33/2 හි පාලිත වීරසේකර මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ගාමිණී ලොකුගේ,**
කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය.

2012 නොවැම්බර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

1A – G 17033 – 355 (2012/12)

මගේ අංකය: අයිආර්/10/06/2012.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ජේ. එස්. පී. කොස්තා මයා, අංක 139, උයන පාර, මොරටුව

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

ඉහත පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ, අධිකාරි විද්‍යුත් විධායක (IV ශ්‍රේණිය) ලෙස සේවය කරන ලද ජේ. එස්. පී. කොස්තා මහතාට 2006 වර්ෂයේ දී වැටුප් විෂමතා ඉවත් කිරීම සඳහා පිහිටුවන ලද වරාය අධිකාරියේ වැටුප් හා සේවක කමිටුවේ නිර්දේශය අනුව 2006.01.01 දින සිට අධිකාරි විද්‍යුත් (II ශ්‍රේණිය) තනතුර හා JLM වැටුප් තලය ලබා නොදීම හේතුවෙන් ඔහුට යම් අසාධාරණයක් සිදු වූයේ ද යන්න හා එසේ වූයේ නම් හිමිවිය යුතු සහන මොනවාද යන්න පිළිබඳව වේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 ඔක්තෝබර් මස 23 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

01 – 32

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.